Problems that can be based on the creation of Inventions related to road safety / මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් නව නිපැයුම් නිර්මාණ සිදු කිරීමේදී ඒ සඳහා පාදක කරගත හැකි ගැටළු පහත පරිදි වර්ගීකරණයවේ.

1. Inventions for pedestrian safety /පදිකයින්ගේ ආරක්ෂාව සඳහා නිර්මාණ

    a. පාර හරහා මාරු වීමේදි පදිකයින්ගේ ආරක්ෂාව වෙනුවෙන් වන නිර්මාණ හෝ වාහනවල රියදුරන්ට පහසුවෙන් පාර හරහා මාරුවන්නේ පදිකයින් (විශේෂයෙන් රාත්‍රි කාලවල) ක්ෂණිකව හඳුනා ගැනිමට හැකි  නිර්මාණ.
    b. නාගරික මාර්ගවල ගමන් කරන විටදී ග්‍රාමීය දුෂ්කර ප්‍රදේෂ පසු කර ගමන් කරන රියදුරන්ට පාර හරහා මාරු වන පදිකයින් දුර සිටම ක්ෂණිකව හඳුනා ගැනීමේ (විශේෂයෙන් රාත්‍රි කාලවල)  ක්‍රමවේදයක් නිර්මාණය කිරීම
    c. පාසල් දරුවන් මහමග ගමන් කරනවිටදි, පාර මාරු වන අවස්ථාවලදි රියදුරු මහතුන්ට ඔවුන්ව ඉක්මනින් හඳුනාගෙන, වැඩි අවධානය ඔවුන් වෙත ලබාගැනිම සම්බන්ධව සුදුසු ක්‍රමවේදයන් නිර්මාණය කිරිම.
    d. මාර්ගය තුල වාහන නියාමනය කිරිමට සිටින රථවාහන පොලිස් නිලධාරි මහතුන්ගේ අධික වෙහෙසකර බව මඟහරවාලිමට හා ඔවුන්ගේ පහසුව සඳහා එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේම පාලනය කලහැකි රථ වාහන නියාමන ක්‍රමවේදයක් සකස් කිරිම.

2. Innovative Solutions for highly accident happening areas /රිය අනතුරු බහුලව සිදුවන ප්‍රදේශ සදහා විසදුම්

    a. රිය අනතුරු බහුලව සිදුවන ප්‍රදේශ/ අනතුරුදායක වංගු/ රියදුරන්ට මාර්ගය අපැහැදිලි ස්ථාන වල රිය අනතුරු වලක්වා ගැනීමට හෝ අවම කර ගැනීමට හැකි ක්‍රමවේදයන්.
    b. අතුරු මාර්ග හරහා ප්‍රධාන මාර්ග වලට අවතිර්ණ වන විටදී (විශේෂයෙන් තුන්මං හංදි), වේගය සීමා නොකර පැමිණි වේගයෙන්ම ප්‍රධාන මාර්ගය වෙත වාහන ඇතුල්වීම මඟින් සිදුවන වාහන ගැටීම් වලක්වාලීම සඳහා ක්‍රමවේදයන් නිර්මාණය කිරිම.
    c. මාර්ගවල අනතුරුදායක, අවදානම් ස්ථාන (විශාල ගස්, පාලම් වල කුළුණු, උමං ද්වාර, විදුලි කණු,පාරට ආසන්නවම කරන වෙළඳ කඩ,ජලාශ, බැමි, බැවුම්, පැති බැවුම්,කඳු හා පාෂණ ගැට්ති) හඳුනා ගැනිමට යොදා ඇති මාර්ග සංඥාවලට වඩා ඉක්මනින් හා පහසුවෙන් ඵලදායි ලෙස රියදුරු වෙත අවදානම් දැනුම්දිම සඳහා ක්‍රමවේදයන් නිර්මාණය කිරිම.
    d. මහමඟ පවතින වංගු හා අවදානම් සහිත ස්ථානයන් වලදි වාහනය පාලනයක් ඇතිව හසුරවාගෙන ආරක්ෂිත වේග සීමා යටතේ ගමන් කරලිමට රියදුරන් දැනුවත් කරලිමේ ක්‍රමවේදයන් නිර්මාණය කිරිම.
    e. හදිසි ප්‍රතිචාර පද්ධති

3. Inventions to help drivers/pedestrians in bad weather conditions, night time and driver fatigue/health monitoring / අයහපත් කාලගුණ තත්ත්වයන්හීදී, රාත්‍රී කාලයන් හීදී හා රියදුරන්ගේ වෙහෙස /සෞඛ්‍යය නිරීක්ෂණය වැනි රියදුරන්ට/ පදිකයින්ට උපකාරවන නව නිර්මාණ

    a. රාත්‍රී කාලයේදී හා නගර ආශ්‍රිතව රිය  අනතුරු අවම කර ගැනීමට හා පදිකයින්ගේ ආරක්ෂාව සඳහා නිර්මාණ.
    b. කාලගුණ හා පාරිසරික තත්ත්වයන් අයහපත් අවස්ථා වන මීදුම අධිකවිම, වර්ෂාව අධිකව පවතින විටදි, ජල ගැලිම්, හිරු උදාවේ සිට හිරු බැස යැම දක්වා සූර්යයා දෙසට මුහුණලා ධාවනය කිරීම, සුළං වැඩි අවස්ථවලද, දුම් අධික හා ලැව් ගිනි නිසා ඇති වන දුමාරය අධික

වන අවස්ථාවලදී වාහන පදවන රියදුරන් හට මාර්ගයේ ඇති අවදානම්භාවය අවම කරලීමට හා පෙර හඳුනා ගැනීමට ක්‍රමවේදයන් නිර්මාණය කිරිම.

c. වාහන පදවන රියදුරන්ගේ අධික වෙහෙසකර ගතිය, නිදිමත ස්වාභාවය, ක්ෂණිකව සෞඛ්‍ය තත්ත්වය අයහපත්වීම් වලදී රියදුරන්ගේ විවේකය පිළිබඳව රියදුරු හා වාහනය තුළ ගමන් කරන මඟින්ව දැනුවත් කිරිමේ ක්‍රමවේදයන් නිර්මාණය කිරිම.

d. රාත්‍රි කාලයන්හි මහමඟ ගමන් කරන විටදි මාර්ගයේ ඉදිරිය පැහැදිලි බව වැඩි කරගැනිමටත්, ඉදිරියෙන් පැමිණෙන වාහනවල ප්‍රධාන ලාම්පු වලින් එන අලෝකය අවම කරලීමට, අඳුරේදි දෘෂ්‍යතාවය වැඩි කරලිමටත් සුදුසු ක්‍රමවේදයන් නිර්මාණය කිරිම

4. Inventions to reduce traffic accidents on highways / අධිවේගී මාර්ගවල (Highway) රිය අනතුරු අවම කර ගැනීමට සඳහා නිර්මාණ

   a. අධිවේගී මාර්ගවල (Highway) ගමන් කරන රියදුරන් හට වාහන අතර පරතරය (අවම 50 M) පවත්වගෙන යාමට  අවධානය යොමු කරලිමේ ක්‍රමවේදයන් නිර්මාණය කිරිම.
   b. අධිවේගී මාර්ගවල (Highway) නඩත්තු කටයුතු / කොන් යොදා මාර්ගය සකස් කිරිම වැනි අවස්ථාවල රියදුරන් වඩා හොඳින් දැනුවත් කිරීමේ නිර්මාණ
   c. අධිවේගී මාර්ගවල (Highway) රියදුරන්ට නින්දයාම/ මාර්ගයේ ලිස්සායාම / අනාරක්ෂිත ස්ථාන හඳුනා ගැනීම සඳහා නව නිර්මාණ
   d. අධිවේගී මාර්ගයට පිවිසෙන රියදුරන් රිය ධාවනය කිරීමට කිරිමට සුදුසු මට්ටමේ සිටීද යන්න හඳුනාගැනීමට උපකරණයක් නිර්මාණය කිරිම. මේ අනුව රියදුරු නිදිමතේ සිටීද, මත්ද්‍රව්‍ය භාවිතා කර සිටීද යන්න මුහුණේ හා ශරීරයේ ඉරියව් මත හඳුනාගත හැකි උපකරණයක් අපේක්ෂා කෙරේ.

5. Inventions related to bicycles/ motorcycles and three wheelers safety / පාපැදිවල/ යතුරුපැදි හා ත්‍රී රෝද රථ ආරක්ෂාව සම්බන්ධ නව නිපැයුම්.

   a. ත්‍රිවිල් රථ රියදුරන් මාර්ග අනතුරු නිර්මාණය කිරිමට දායක වන ප්‍රධාන කාණ්ඩායමක් නිසා ත්‍රීවිරලය තුල සිදු කල හැකි අනවශ්‍ය හැරවීම් නවතා පාලනයක් ඇතිව මාර්ගයේ ධාවනය කළ හැකි ක්‍රමවේදයන් නිර්මාණය කිරිම.
   b. යතුරුපැදි මගින් එක පෙළට මාර්ගය අවහිර කරමින් ගමන් කිරීමත්, අනවශ්‍ය ලෙස මංසන්ධි වල එක පෙළට නතර කර විවධ දිශාවන්වලට මාර්ගය අවහිර කරමින් අපරික්ෂාකාරීව ධාවනය කිරිම නිසා පසුපසින් පැමිණෙන රථයන්හි සිදුවන ගැටීම් වලක්වාලීම සඳහා ක්‍රමවේදයන් නිර්මාණය කිරිම.
   c. පාපැදිවල ගමන් කරන පුද්ගලයින්ට සිදුවන අනතුරු අවම කිරිම සඳහා නිර්මාණයක් .

6. Inventions related to traffic signals and Traffic lights / ආලෝක සංඥා (Color Light )  / මාර්ග සංඥා ආශ්‍රිත නව නිර්මාණ

   a. මහමඟ ප්‍රදර්ශනය කර ඇති විවිධ වර්ණ ගැන්වූ පුවරු නිසා ක්ෂනිකව මාර්ග සංඥා නිශ්චිතව හඳුනාගැනිමට නොහැකිවිම නිසා සිදු විය හැකි අනතුරු වලක්වාලීම සම්බන්ධව සුදුසු ක්‍රමවේදයන් නිර්මාණය කිරිම.
   b. මාර්ගයේ දෙපැත්ත වෙන් කරන මාධ්‍ය රේඛාව(Center Median of the Road)  රියදුරු මහතුන්ට පහසුවෙන් වෙන් කර හඳුනා ගැනිමේ ක්‍රමවේදයන් නිර්මාණය කිරිම.
   c. ආලෝක සංඥා  ( Color Light )  නිසි පරිදි ක්‍රියාත්මක නොවීම. (Timing Mistakes).

7. Inventions/ mobile app to obtain digital evidence and improve road use / ඩිජිටල් සාක්ෂි ලබාගැනීමට හා මාර්ගය භාවිතය කාර්යක්ෂම කිරීමේ නව නිර්මාණ / මොබයිල් ඇප්

   a. වර්තමාන CCTV කැමරා වෙනුවට දේශගුණික හා පාරිසරික තත්ත්වයන්ට ඔරොත්තු දෙන කැමරා පද්ධතියක් හෝ ඒ හා සමාන නිර්මාණ.
   b. තමන් සිටින ස්ථානය අනුව මාර්ගයේ ගමන් කළ හැකි උපරිම වේගය රියදුරාට දැනුම් දෙන ක්‍රමයක් සකස් කිරීම වීඩියෝ හෝ ඕඩියෝ වශයෙන් ඇසීමට සැලැස්වීම.
   c. IOT/ කෘතිම බුද්ධිය භාවිත කර රියදුරන් සඳහා වන නව නිර්මාණ

8. Inventions/ mobile app to make public transport efficient and safe / පොදු ප්‍රවාහන මාධ්‍යන් කාර්යක්ෂම සහ ආරක්ෂිත කිරීමට නව නිර්මාණ/ මොබයිල් ඇප්

   a. මාර්ග වල ධාවනය වන පොදු ප්‍රවාහන මාධ්‍යන් (බස් රථ) ධාවනය වන වේලාවන් පිළිබඳව සහ ගමනාරම්භයේ සිට අවසානය දක්වා රථයේ තොරතුරු මගීන්ට දැන ගැනීමට හැකි app එකක් නිර්මාණය කිරීම.

9. Inventions to reduce railway crossing accidents / දුම්රිය හරස් මාර්ග අනතුරු අවම කර ගැනීමට සඳහා නිර්මාණ

   a. දුම්රිය මාර්ගයේදී අනතුරු සිදු විය හැකි අවස්ථාවන් අවම කර ගැනීමට නව නිර්මාණ
   b. රාත්‍රී කාලයේ මහා මාර්ගයේදී හා දුම්රිය මාර්ගයේදී සතුන් වාහන වල හැප්පීම වැලැක්වීමට යොදා ගත හැකි නිරිමාණයක්. මාර්ගයේ සතෙකු සිටිනවානම් ඒ පිළිබඳව රියදුරා දැනුවත් වීමට මාර්ගයේ හෝ රථයේ සවි කල හැකි උපකරණයක් නිර්මාණය කිරීම.

10. Inventions to easily and quickly check the suitability & fitness of vehicles / වාහනවල තිබිය යුතු යෝග්‍යතාවය පහසුවෙන් හා ඉක්මනින් පරීක්ෂා කිරීමට නව නිර්මාණ

    a. මාර්ග තුල ධාවනය කරන වාහනවල තිබිය යුතු යෝග්‍යතාවය පහසුවෙන් හා ඉක්මනින් පරීක්ෂා කරලීමට නිසි ක්‍රමවේදයක් සකස් කිරීම. උදා -: දුම් පරීක්ෂා කිරීමට, අඳුරු වීදුරු පරික්ෂා කිරීමට, වාහනයේ ශබ්දය පරික්ෂා කිරීමට.
    b. ටයර/ තිරිංග වල යෝග්‍යතාවය පරික්ෂා කිරීමට නව නිර්මාණ

11. Inventions to stop drug and alcohol driving and illegal transportation / මත් ද්‍රව්‍ය හා මත්පැන් භාවිත කර රිය පැදවීම හා නීති විරෝධී දෑ ප්‍රවාහනය නැවත්වීමට නව නිර්මාණ.

    a. මත් ද්‍රව්‍ය හා මත්පැන් භාවිත කර රිය පැදවන රියදුරන් හඳුනාගැනීමට නව නිර්මාණ.
    b. මත් ද්‍රව්‍ය හා මත්පැන් ප්‍රවාහනය නැවත්වීමට නව නිර්මාණ.
    c. නීති විරෝධී දෑ ප්‍රවාහනය නැවත්වීමට නව නිර්මාණ.

12. Other road safety related innovations /වෙනත් මාර්ග ආරක්ෂාව සම්බන්ධ නව නිර්මාණ

    a. ඉහත සඳහන් කිසිදු කාණ්ඩයකට අයත් නොවන ඔබ සතු නව නිපැයුමක් මාර්හ ආශ්‍රිතව ඇතිවන අනතුරු අවම කර ගැනීම හෝ වලක්වා ගැනීමට උපයෝගී කර ගත හැකිනම් එවැනි නව නිපැයුම්ද මෙම ව්‍යාපෘතිය සඳහා ඉදිරිපත් කල හැකිවේ